‘නියත වශයෙන්ම ඔබ ගලක් බව මම මැනවින් දනිමි. හිංසාවක් කිරීමට හෝ යහපතක් ගෙන දෙන්නට හෝ ඔබට නොහැකි ය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔබ ව සිප ගනු මා නොදුටුවේ නම් මම ඔබ සිප නොගනිමි." යැයි පැවසීය

උමර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “නියත වශයෙන්ම එතුමා හජර් අල් අස්වද් (හෙවත් කඃබාවෙහි තැන්පත් කොට ඇති ගල) වෙත පැමිණ එය සිප ගෙන ‘නියත වශයෙන්ම ඔබ ගලක් බව මම මැනවින් දනිමි. හිංසාවක් කිරීමට හෝ යහපතක් ගෙන දෙන්නට හෝ ඔබට නොහැකි
ය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔබ ව සිප ගනු මා නොදුටුවේ නම් මම ඔබ
සිප නොගනිමි." යැයි පැවසීය. [صحيح] [متفق عليه]

දේවත්වය විශ්වාස කරන්නන්ගේ ප්රධානියෙකු වූ උමර් ඉබ්නු අල්-කත්තාබ් (රළියල්ලාහු අන්හු) තුමා හජර් අල් අස්වද් හෙවත් කඃබාවෙහි කොනක තැන්පත් කොට ඇති ගල වෙත පැමිණ එය සිප ගෙන මෙසේ පවසා සිටියේය: "නියත වශයෙන්ම ඔබ ගලක් බව මම දනිමි. හිංසාවක් කිරීමට හෝ සෙතක් සැලසීමට හෝ ඔබට නොහැකි ය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔබ ව සිප ගනු මා දැක නොතිබුණේ නම් මම ඔබ සිප නොගනිමි."

https://sunnah.global/hadeeth/si/show/3024